කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (විශේෂ) - දෙවන වසර

සෙමෙස්තර අවසාන පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2018/2019

# DMG 2223 : ප්‍රජාවිද්‍යා විශ්ලේෂණ

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න

ගණක යන්ත්‍ර භාවිතා කල හැකිය කාලය: පැය දෙකයි (02)

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු පහකින් (05) සමන්විත වේ

---

1. අ) X නමැති රට සඳහා වගුවෙහි දී ඇති දත්ත භාවිතා කරමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

| වයස් කාණ්ඩය | ස්ත්‍රී ජනගහනය (000) | පුරුෂ ජනගහනය (000) |
|---|---|---|
| 0-4 | 96,456 | 89,564 |
| 5-9 | 189,562 | 170,569 |
| 10-14 | 154,782 | 200,132 |
| 15-19 | 550,573 | 423,582 |
| 20-24 | 221,026 | 321,456 |
| 25-29 | 73,150 | 82145 |
| 39-34 | 32,184 | 45,321 |
| 35-39 | 20,396 | 25,789 |
| 40-44 | 15,826 | 14,655 |
| 45-49 | 16,759 | 18,654 |
| 50-54 | 17,600 | 18,798 |
| 55-59 | 16,964 | 14,654 |
| 60+ | 86,260 | 98,732 |

i. සමස්ත පුමිතිරි අනුපාතය

ii. මහලු වයස් යැපුම් අනුපාතය

iii. ස්ත්‍රී ජනගහනයේ ප්‍රතිශතය

iv. ළමා - ස්ත්‍රී අනුපාතය

v. වියපත්වීමේ දර්ශකය

(ලකුණු 10)

ආ) කාල දත්ත සහ ගණ දත්ත අතර පවතින සම්බන්ධය දැක්වීමට ලෙක්සිස් රූප සටහන (Lexis diagram) යොදාගන්නා ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) ජනගහන දර්ශක ගණනය කිරීම්වලදී මධ්‍ය වාර්ෂික ජනගහනය යොදා ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

02. අ) 'X' නමැති රටෙහි 2000-2002 වර්ෂයන්හි ස්ත්‍රීන් සඳහා සකස් කරන ලද පහත ජීවන වගුව සම්පූර්ණ කරන්න.

| වයස | $_nq_x$ | $l_x$ | $_nd_x$ | $_nL_x$ | $T_x$ | $e_x$ |
|---|---|---|---|---|---|---|
| 30 | 0.0114 | 96012 | | 477323 | 4302942 | 44.82 |
| 35 | 0.0164 | | | | | |
| 40 | 0.0114 | | | | | |
| 45 | 0.0228 | | | | | |
| 50 | 0.0340 | | | | | |
| 55 | 0.0474 | | | | | |
| 60 | 0.0827 | | | | | |
| 65 | 0.1189 | | | | | |
| 70+ | | 67079 | 67079 | 810133 | 810133 | |

(ලකුණු 10)

ආ) ඉහත ජීවන වගුව සඳහා ඔබ ලබාගත් පිළිතුරු භාවිතා කර පහත දෑ ගණනය කරන්න.

i. දැනට අවුරුදු 30 ක වයසේ සිටින ස්ත්‍රීන්ගෙන් අවුරුදු 60 වනතුරු ජීවත් වන අනුපාතය

(ලකුණු 03)

ii. දැනට අවුරුදු 40 ක් වන ස්ත්‍රීන් 3000කින් අවුරුදු 65 දී මරණයට පත්විය හැකි ස්ත්‍රීන් සංඛ්‍යාව

(ලකුණු 03)

iii. වයස අවුරුදු 30ට වැඩි මුළු ස්ත්‍රී ජනගහනය

(ලකුණු 02)

ඇ) ජීවිත අපේක්ෂාව ($e_x$) තීරුව සම්බන්ධයෙන් ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

(ලකුණු 02)

3. අ) A නමති රටෙහි සඵලතා මිණුම් කිහිපයක් පහත දැක්වේ.

මුළු සඵලතා අනුපාතිකය (TFR) = 3.539

දළ ප්‍රජනන අනුපාතිකය (GRR) = 1.724

ශුද්ධ ප්‍රජනන අනුපාතිකය (NRR) = 1.668

ඉහත මිණුම් පිළිබඳ කෙටි අර්ථ දැක්වීමක් කරන්න.

(ලකුණු 06)

ආ) සඵලතා අධ්‍යනවල ජාතභාව ප්‍රජනන අනුපාතයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) පහත සඳහන් වගුවෙහි දත්ත භාවිතා කොට Y නමැති රටෙහි කාන්තාවන් සඳහා ප්‍රථම විවාහයේ මධ්‍යනය වයස ගණනය කරන්න.

| වයස් කාණ්ඩ | ස්ත්‍රී ජනගහනය | අවිවාහක ස්ත්‍රී ජනගහනය |
|---|---|---|
| 15 ට අඩු | 3,456,230 | 3,442,010 |
| 15-19 | 756,897 | 590,321 |
| 20-24 | 876,345 | 345,765 |
| 25-29 | 543,768 | 112,567 |
| 30-34 | 435,789 | 45,876 |
| 35-39 | 345,786 | 34,654 |
| 40-44 | 290,764 | 25,675 |
| 45-49 | 216,790 | 16,491 |
| 50-54 | 196,345 | 9,760 |

ඈ) ඔබගේ පිළිතුර පිළිබඳ අර්ථ දක්වන්න.

(ලකුණු 06)

(ලකුණු 02)

4. ආ) පහත සඳහන් දත්ත භාවිතා කොට X නැමැති රටෙහි 2005 සහ 2015 කාල පරිච්ඡේදය සඳහා වයස අවුරුදු 10 – 40 ත් අතර ජනගහනයේ ශුද්ධ සංක්‍රමණය ඉදිරි ප්‍රවර්ධන අනුපාත ක්‍රමය භාවිතා කරමින් ගණනය කරන්න.

| වයස් කාණ්ඩය 2005 | ජනගහනය 2005 | වයස් කාණ්ඩය 2015 | ඉදිරි පැවතුම් අනුපාත(දස අවුරුදු) | ජනගහනය 2015 |
|---|---|---|---|---|
| 10-14 | 85,460 | 15-19 | 0.99333 | 158,852 |
| 15-19 | 98,453 | 20-24 | 0.99645 | 190,457 |
| 20-24 | 135,871 | 24-29 | 0.99160 | 231,654 |
| 24-29 | 112,459 | 30-34 | 0.98962 | 151,564 |
| 30-34 | 99,561 | 35-39 | 0.98631 | 102,985 |
| 35-39 | 85,236 | 40+ | 0.98070 | 65,821 |

(ලකුණු 10

ආ) 2005 වර්ෂයේ අවුරුදු 15-19 සිටි වයස් කාණ්ඩය සඳහා 2015 වර්ෂයේ දී ශුද්ධ සංක්‍රමණයේ බලපෑ රූප සටහනක් ඇසුරින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 05

ඇ) ඔබ කැමති දත්ත භාවිතා කරමින් ජීව සංඛ්‍යාති ක්‍රමය මගින් ශුද්ධ සංක්‍රමණය ගණනය කරන ආකාර පැහැදිලි කරන්න.

(ලකුණු 05

05. අ) දළ මරණ අනුපාතිකය රටවල් අතර මර්ත්‍යතාවය සන්සන්දනය සඳහා සුදුසු මිනුමක් නොවේ. කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06

ආ) 2010 වර්ෂයේදී ප්‍රදේශයක හෘද රෝග විශේෂිත මරණ අනුපාතිකය ලක්ෂයකට 35 ක් වූ අතර එ රෝගයෙන් 2010 වර්ෂය තුළදී 90 ක් මිය ගියහ. මෙම වර්ෂයේදී ප්‍රදේශයෙහි දළ මරණ අනුපාතික 7.2 ක් වූ අතර සිදු වූ මරණ අතුරින් 49.3 % ක් ස්ත්‍රී මරණ විය. මෙකී වර්ෂයේදී මධ්‍ය වාර්ෂි ජනගහනයෙහි පුමිතිරි අනුපාතය 113.9 කි. මෙම දත්ත භාවිතා කොට 2010 වර්ෂය සඳහා මෙ ප්‍රදේශයේ පහත මිනුම් ගණනය කරන්න.

i. හෘද රෝග විශේෂිත මරණ ප්‍රතිශතය

ii. දළ මරණ අනුපාතිකය (පුරුෂ)

iii. දළ මරණ අනුපාතිකය (ස්ත්‍රී)

(ලකුණු 08

ඇ) පහත වගුවෙහි 'Z' නමැති රට සඳහා දී ඇති දත්ත භාවිතා කරමින්,

i. මුලු ජනගහනය ගණනය කරන්න.

ii. එක් එක් වයස් කාණ්ඩ සඳහා ස්ත්‍රී පුරුෂ සමානුපාත ගණනය කරන්න.

iii. පහත වගුවෙහි දත්ත භාවිතා කරමින් නමැති රටෙහි ජනගහන ව්‍යුහය පෙන්විම සඳහා ජනගහන පිරමීඩයක ආකෘතියක් ඇඳ දක්වන්න

| වයස් කාණ්ඩ | ස්ත්‍රී ජනගහනය (දහසකට) | පුරුෂ ජනගහනය (දහසකට) |
|---|---|---|
| 0-9 | 4770 | 4512 |
| 10-19 | 3603 | 3174 |
| 20-29 | 3266 | 2294 |
| 30-39 | 2136 | 2069 |
| 40-49 | 1150 | 1106 |
| 50-59 | 1062 | 1006 |
| 60-69 | 711 | 773 |
| 70+ | 272 | 441 |

(ලකුණු 06)